12(1), 14(9)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023-01-09

පැමිණිලි පාර්ශවය :- මොහොමඩ් අලියාර් නූර්දින් මහතා ,
අංක 03, මුතලියාර් පාර,
අක්කරපත්තුව.

වගඋත්තර පාර්ශවය :- 01 ප්‍රධාන විධායක නිළධාරි,
ගල්ඔය වැවිළි සමාගම,
හිඟුරාණ.

02 දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර.

<u>පැමිණිලි අංකය :- **HRC/AM/96/18**</u>

ඉහත පැමිණිලිකරු විසින් උක්ත අංක දරණ පැමිණිල්ල මගින්, කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 1963 වර්ෂයේ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය විසින් අත්පත් කර ගන්නා ලද තමාගේ කුඹුරු ඉඩම් සඳහා 1978 වර්ෂයේ දී විකල්ප ඉඩම් ලෙස ඒ අවට ඉඩම් අක්කර දෙකහමාරක් ලැබුණු බවත්, ඒ සඳහා H 167/16 අංක යටතේ 1997/02/10 බලපත්‍ර ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදී ඇති බවත්, එහි මායිම වෙල්ලකාඩු ගොවි සංවිධානයට අයත් කුඹුරු යායට අනුබද්ධව බවත් සඳහන් කර ඇත. උක්ත කුඹුරු ඉඩම උක්වගා කොටසේ මායිම් කුණු ඇළට යාබදව පිහිටා ඇති අතර, එය වගුරු හා මඩ සහිත පහත් බිම් කොටසක් බැවින් තමා එම ඉඩම 1972 වසරේ සිට වී වගා කළ බවත් සඳහන් කර ඇත. ගල්ඔය වැවිළි සමාගම අදාළ ඉඩම් උක් වගා කරන ලෙස දන්වා එහි බර වාහන යොදා වලවල් කපා විනාශයට පත්කර ඇති බවත්, නමුත් එම ඉඩම් උක්වගාවට නුසුදුසු යැයි ශිෂ්‍ය විද්‍යාඥයින් අධීක්ෂණයක් කර වාර්තා කර ඇති බවද පවසා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி } 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு } 1996
වෙබ් / இணையம் } www.hrcsl.lk

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු:-**

(464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ19(2) වන වගන්තිය යටතේ මෙම ඉඩම සඳහා පැමිණිලිකරු නමින් AP H/ 167/C/16 බලපත්‍රය 1997/2/10 වන දින නිකුත් කර ඇති බව නිරීක්ෂණය වන අතර, 1992/03/23 වන දින කෘෂි අධිකාරී කාර්යාලය, හිඟුරාණ, විසින් නේවාසික සාමාන්‍යාධිකාරි හිඟුරාණ වගා කළමණාකරු වෙත අංක 450/01/08 අංක දරණ ලිපියෙන් තමන් අංක 167-138 ඉඩම් ශිෂ්‍ය විද්‍යාඥ මානක නිලධාරී , උක් වගා සමිති නියෝජිතයින් හා තමා පරීක්ෂා කළ බවත්, එම ඉඩම් උක් වගා කිරීමට නුසුදුසු ඉඩම් බව ශිෂ්‍ය විද්‍යාඥ නිරීක්ෂණය කර ඇති බවත් අනාවරණය වේ.

උක්ත ඉඩම පරීක්ෂා කර 2019 වර්ෂයේ මාසය හා දිනයන් රහිත ප්‍රාදේශීය ලේකම් එරගම ගේ (LAD/CMPLA/2014) 50 අංක දරණ ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම්, අම්පාර වෙත යොමු කර ඇති ලිපියේ අංක 03 මඟින් මෙම ඉඩමෙහි දැනට වසර 30 ක පමණ කාලයක සිට නොකඩවා වී වගාව සිදු කර ඇති බව සනාථ වන අතර, මෙම ඉඩමෙහි ස්වභාවික පිහිටීම අනුව හා අනෙකුත් පාරසරික ලක්ෂණ අනුව උක්වගාව සඳහා සුදුසු නොවන ඉඩමක් බව අනාවරණය කර ඇත.

අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ADM/ESTD/HUMAN/0260 YD 2019/05/21 දරණ වාර්තාවේ අදාළ ඉඩම උක්වගාව සඳහා සුදුසු ඉඩමක් නොවන බව තහවුරු වන බව එහි අංක 06 මඟින් අදාළ ඉඩම් කොටස ආසන්නයේ එරගම ජලාශයේ රක්ෂිත ප්‍රදේශයේ මායිම් සලකුණු කර ඇති අතර, මෙම ඉඩම වාරි ජලයට හා වැසි ජලයට යටවීමේ අවධානම සැළකිල්ලට ගත් කළ මෙය උක්වගාව කිරීම සඳහා යෝග්‍ය නොවන බව සඳහන් වේ. එසේ හෙයින් වෙනත් වගාවක් සඳහා මෙම බිම් කොටස නිදහස් කිරීම සුදුසු වන බව සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

හිඟුරාන සීනි කර්මාන්තය අකර්මන්‍ය වී තිබූ වසර 15 ක් පමණ වූ කාලයේ එකී ආයතනය සතු ඉඩම් සම්බන්ධව කටයුතු කළේ ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරයා විසින් වන අතර, ඉඩම් සම්බන්ධයෙන් ඇතිවන ගැටළු වලදී ඒවා පිළිබඳව අධීක්ෂණය, නිර්දේශ ලබාදීම සිදුකරනුයේ ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරයා විසින් හා ඉඩම් කොමසාසරිස් ජනරාල් විසින් වේ. හිඟුරාණ සීනි කර්මාන්තය නැවත ආරම්භ වීමෙන් පසුවද, එය තවදුරටත් එසේ සිදුවේ. දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රශ්නුත ඉඩම උක් වගාවට නුසුදුසු හා වෙනත් වගාවක් කිරීමට සුදුසු බවට නිර්දේශයක් ලබා දී ඇත්තේ එහෙයිනි.

එමෙන්ම වගඋත්තරකාර ගල්ඔය වැවිළි සමාගම විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2019.01.10 දිනැති පැමිණිල්ලට අදාළ වාර්තාවේ, උක්වගාව සඳහා <u>පමණක්</u> වෙන් කොට ඇති ඉඩම් කට්ටි වල උක් වගා කළ යුතු බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් නඩු තීන්දුවක් ලබා දී ඇති බව දන්වා ඇත. එම තීන්දුවට අනුව හිඟුරාන සීනි කර්මාන්තයට අයත් ඉඩම් වල උක්වගාව පමණක් කළ යුතු බවට තීරණය කළද, ගැටළු සහගත

ඉඩමට එය අදාළ කර ගත නොහැක්කේ වසර 30කට වැඩි කාලයක් තුළ මෙම ඉඩමේ උක් වගාකර නොමැති බැවිනි. එය සාක්ෂි සහිතව තහවුරු වී ඇති අතර, ඒ අනුව පැමිණිලිකරු වෙනුවෙන් ප්‍රශ්නගත ඉඩමේ වෙනත් වගාවක් කිරීමට ඉඩදීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීමට නීතිමය බාදාවක් නොමැති බව නිරීක්ෂණය වේ.

ඉහත අනාවරණය වන සියළු කරුණු අනුව අදාළ ඉඩම උක්වගාව සඳහා සුදුසු නොවන බව නිරීක්ෂණය වන බැවින් වෙනත් වගාවන් සඳහා ලබාදිය හැකි දැයි 2019.06.10 වන දින පැවති පරීක්ෂණයේදී කරන ලද විමසීමට අනුව, එයට සහභාගී වූ ගල්ඔය වැවිලි සමාගමේ නියෝජිත නිලධාරින් දන්වා ඇත්තේ, ඒ පිළිබඳව තමන්ට තීරණයක් ගත නොහැකි බවත්, ඒ සඳහා මාණ්ඩලික තීරණයක් ගත යුතු බවත්, ඒ සඳහා විධායක නිලධාරි ගල්ඔය වැවිලි සමාගම වෙත ඒ පිළිබඳව දැන්වීම සුදුසු බවත් දන්වා ඇත.

එසේම සමථකරණයේදී පැමිණිලිකරු කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ, අදාළ ඉඩමේ උක් වගා කළ නොහැකි බවත්, සමාගම විසින් එය උක්වගාව සඳහා සුදුසු බව ප්‍රකාශ කරන්නේ නම් ගල්ඔය වැවිලි සමාගම විසින් එහි උක්වගා කර නඩත්තු කර වියදම අයකරගෙන වාර්ෂිකව තමන්ට එහි ලාභය ගෙවීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් තමන්ගේ විරුද්ධත්වයක් නොමැති බවත්ය.(අවම වශයෙන් වර්ෂයකට රුපියල් ලක්ෂයක මුදලක් ) එම පරීක්ෂණයට සහභාගී වූ නිලධාරීන් දන්වා ඇත්තේ, මෙම තත්ත්වය පිළිබඳ ගල්ඔය වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තීරණයක් ගත යුතු බවයි.

ඉහත අනාවරණය වූ කරුණු අනුව අදාළ ඉඩම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස ගල්ඔය වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි වෙත දැන්වූවද, එයට පිළිතුරු ලබාදීමට ගල්ඔය වැවිලි සමාගම කටයුතු කර නොමැත.

පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත්තේ, තමාට අදාළ ඉඩමේ වගා කටයුතු සිදු කර ගැනීමට නොහැකිවීමෙන් විශාල ආර්ථික පාඩුවක් සිදුවන බවත් , එබැවින් තමාට ඉක්මනින් මේ පිළිබඳ කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙසත්ය.

**නිගමනය :-**

අදාළ රාජ්‍ය නිලධාරීන් විසින් පැමිණිලිකරුට අයත් ඉඩම උක්වගාව සඳහා නුසුදුසු බව තීරණය කර තිබියදී එය නොසලකා හරිමින් වගඋත්තර ගල්ඔය වැවිලි සමාගම විසින් පැමිණිලිකරුට බලපෑම් කරමින් නීතියට පටහැනිව ක්‍රියා කරමින් කටයුතු කිරීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුකම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (i) හා 14(ඌ) වගන්ති ප්‍රකාරව පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුකම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (i) හා 14(ඌ) වගන්ති ප්‍රකාරව පැමිණිලිකරු වෙත හිමිව ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින් හා ඉහත අනාවරණය වන සියළු කරුණු අනුව අදාළ ඉඩම උක්වගාව සඳහා සුදුසු නොවන  බව නිරීක්ෂණය වන බැවින් පැමිණිලිකරු හිමිකම් කියන ඉඩමේ උක් වගාවෙන් බැහැරව වෙනත් වගාවක් කිරීම සඳහා අවසර ලබා දීමට වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කළ යුතු බවට නිර්දේශය කරනු ලැබේ.

2023. 02 . 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

වෛ.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
10 වන මහල, සෙත්සිරිපාය දෙවන පියවර,
බත්තරමුල්ල.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අම්පාර.

B/